# සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## 2015


**30** වන මහල**,** බටහිර කුළුණ**,** ලෝක වෙළඳ මධ්‍යස්ථානය**,** කොළඹ **- 01**

දුරකථන : 011-2337629

ෆැක්ස් : 011-2337627

ඊ-මේල් : info@modsit.gov.lk

# දැක්ම

2020 වසර වන විට ගෝලීය වශයෙන් තරඟකාරී වෙළඳ රජ්‍යයන් අතරින් ශ්‍රී ලංකාව කලාපයේ වඩාත්ම ආකර්ශනීය ආයෝජන කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම.

# මෙහෙවර

**ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳාම තුළ අගය එකතුකළ භාණ්ඩ හා සේවා සැපයීම මඟින් උපායමාර්ගිකව ප්‍රවර්ධනය කිරීම.**

2002 සැප්තැම්බර් 12 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 402 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති අවශ්‍යතාවට අනුකූල වීම පිණිස සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015 පිළියෙළ කර තිබේ.

ලේකම්
සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
31.12.2015

# පටුන


1. හැඳින්වීම ........................................ 5

1.1 පසුබිම ........................................ 5

1.2 පරමාර්ථ හා කාර්යභාරය ........................................ 5

2. ප්‍රතිපත්ති සංදර්භය ........................................ 6

2.1 හැඳින්වීම ........................................ 6

2.2 අමාත්‍යාංශයේ මූලික ප්‍රතිපත්ති ........................................ 6

3. සංවර්ධනය සඳහා මුල් පියවර ........................................ 6

3.1 හැඳින්වීම ........................................ 6

3.1.1 ආයෝජන මණ්ඩලය තුළ සියලු සේවා එක් ස්ථානයකින් ලබා ගත හැකි මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම. ........................................ 6

3.1.2 අපනයන කරුවන්ගේ සංසදය ........................................ 7

3.1.3 සංවර්ධනය සඳහා වූ නියෝජිත ආයතනය හා ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිත ආයතන ........................................ 7

3.1.4 නිදහස් වෙළඳ කලාප සමීප අධීක්‍ෂණය ........................................ 8

3.1.5 ව්‍යාපාරවල නිරතවීමේ දර්ශකය වැඩිදියුණු කිරීම හා ආයෝජන වාතාවරණය වැඩි දියුණු කිරීම. ........................................ 8

3.1.6 තාක්‍ෂණය හා නවීකරණය මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්වල අපනයන සඳහා වන තරගකාරීත්වය වැඩි දියුණු කිරීම. ........................................ 8

3.1.7 ඉන්දියාව සමඟ ගිවිසුම් ගත වීමට අපේක්ෂිත ආර්ථික හා තාක්‍ෂණික සහයෝගීතා ගිවිසුම. ........................................ 9

3.1.8 ජාතික වැදගත්කමකින් යුත් ගැටළු පිළිබඳව ඉතා වැදගත් වන අධීක්ෂණ කටයුතු මෙහෙයවීම. ........................................ 9

4. සාමාන්‍ය පරිපාලනය ........................................ 9

4.1 හැඳින්වීම ........................................ 9

4.2 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ........................................ 10

5. මූල්‍ය අංශය ........................................ 13

6. උපලේඛන ........................................ 16

# 1. හැඳින්වීම

## 1.1 පසුබිම

2015 සැප්තැම්බර් 21 වන සඳුදා දින ප්‍රසිද්ධ කරන ලද අංක 1933/13 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විෂය රජයේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව මෙම අමාත්‍යාංශය වෙත පවරා තිබේ. ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට පමුණුවා තිබේ.

## 1.2 පරමාර්ථ හා කාර්යභාරය

ගැසට් නිවේදනයට අනුව මෙම අමාත්‍යාංශයේ සුවිශේෂි කාර්යය හා කර්තව්‍ය පහත දක්වා තිබේ.

1. ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම සහ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විෂය මෙන්ම දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයන් සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකිරීම හා ඇගයීම.

2. ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.

3. ශ්‍රී ලංකාවේ ආර්ථික විභවය ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් විදේශ සෘජු ආයෝජන හා පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

4. දේශීය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම.

5. ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර අනුගමනය කිරීම.

6. කලාපීය ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති, ක්‍රමෝපාය, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.

7. බහු - පාර්ශ්වීය හා ද්වි - පාර්ශ්වීය ආර්ථික ගිවිසුම් සම්බන්ධ කරුණු.

8. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය හා අධීක්ෂණය කිරීම.

9. අපනයන විවිධාංගීකරණය, අපනයන සංවර්ධනය සහ උපදේශන සේවා සඳහා දිරිගැන්වීම් ලබාදීම.

10. විදේශ රටවල පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ වෙළඳ කටයුතු නියෝජනය කිරීම.

11. උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා තරුණ ප්‍රජාවට පහසුකම් සලසා දීම.

12. අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආයතනවලට පවරා ඇති වෙනත් සියලු විෂයන්වලට අදාළ කටයුතු.

13. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතනවල අධීක්ෂණ කටයුතු.

පසුකාලීනව, අග්‍රාමාත්‍යවරයාගේ ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික ආර්ථික සාකච්ඡා සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කිරීම ද සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හරහා සිදු කිරීමට රජය තීරණය කරන ලදී.

## 2. ප්‍රතිපත්ති සංදර්භය

### 2.1 හැඳින්වීම

මෙම අමාත්‍යාංශය ස්ථාපිත කිරීමේ ඉතා වැදගත් අරමුණු වූයේ තිරසාර සංගත ආයෝජන වාතාවරණයක් ඇති කිරීම හා ගෝලීය වෙළඳපොල තුළ දේශීය නිෂ්පාදනයට ඉහළ ආදායමක් ලබාගත හැකි පරිසරයක් සකස් කිරීමයි. මෙම සන්දර්භය තුළ, ක්‍රමෝපායික උපදෙස් සමඟ කළමනාකරණය කළ හැකි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය බවට පත්වී තිබේ. අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ සුදුසු රෙගුලාසි වැඩි දියුණු කිරීම සහ සුසංගත කළ හා සම්බන්ධීකරණය කළ සේවයක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම පිණිස අදාළ නියෝජනයන් මෙහෙයවීම යනාදිය අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීම් අතර වේ.

### 2.1 අමාත්‍යාංශයේ මූලික ප්‍රතිපත්ති

අමාත්‍යාංශයේ සියලු ක්‍රියාකාරකම් පුළුල් ප්‍රතිපත්ති සතරක් යටතේ සලකා බලනු ලැබේ.

- විදේශ සෘජු ආයෝජන හා පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- දේශීය නිෂ්පාදකයින් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.
- ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළඳ හා ආර්ථික සහයෝගීතාවයන් තුළින් ජාත්‍යන්තර වෙළඳාම සවිබල ගැන්වීම.
- තරුණ පුද්ගලයින් සඳහා උසස් අධ්‍යාපනය සඳහා පවතින පහසුකම් පුළුල් කිරීම.

## 3. සංවර්ධනය සඳහා මුල් පියවර

### 3.1 හැඳින්වීම

ආර්ථික ප්‍රතිපත්ති රාමුව හා 2016 අයවැය ප්‍රකාශය මගින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ක්‍රමෝපායික ප්‍රතිපත්ති මඟපෙන්වීම සිදුකරයි. සමස්ත අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් අදාළ ආයතනවලට පහසුකම් සැලසීමට හා සමායෝජනය කිරීමට අමාත්‍යාංශය මගින් සුවිශේෂී වැඩසටහන් කීපයක් ආරම්භ කර තිබේ.

#### 3.1.1 ආයෝජන මණ්ඩලය තුළ සියලු සේවා එක් ස්ථානයකින් ලබා ගත හැකි මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

මෙහි අරමුණ වන්නේ ආයෝජන සඳහා නියාමන බාධා හා කාර්ය පාටිපාටික ප්‍රමාදයන් ඉවත් කිරීමයි. විදේශ සෘජු ආයෝජන සඳහා බාධක අවම කිරීම තුළින් රට තුළට ආයෝජන ආකර්ෂණය කිරීමේ රජයේ වෑයම සඳහා පහසුකම් සලසාදීමක් සිදුවේ.

ව්‍යාපෘති අනුමත කිරීම, දිරි දීමනා ලබාදීම, නීති උපදෙස් ලබාදීම, ජලය, බල ශක්තිය හා අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, ව්‍යාපාරිකයන් සඳහා වීසා ලබාගැනීම සඳහා සහාය දැක්වීම. ආනයන හා අපනයන නිෂ්කාශනය සඳහා පහසුකම් සැලසීම ආදිය ඇතුළත්ව පුළුල් පරාසයක සේවා සැලසීම එම මධ්‍යස්ථානයේ අභිප්‍රායයි. මෙම මධ්‍යස්ථානය තුළ සේවා සැපයීම සඳහා ආයතන 14 ක් හඳුනා ගෙන තිබෙන අතර එක් එක් නියෝජිතායතනය මගින් බලතල පැවරූ නිලධාරීන් මෙම මධ්‍යස්ථානයේ සේවය කිරීම සඳහා පත් කරනු ලබනු ඇත.

මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු වන්නේ මෙම ක්‍රියාවලිය වේගවත් කිරීම පමණක් නොව මෙම ක්ෂේත්‍රයේ පවතින අක්‍රමිකතා ඉවත් කරමින් විනිවිදභාවයකින් කටයුතු කිරීමේ ඉඩකඩ වැඩි දියුණු

කිරීමයි. නියෝජිතායතන තුළ සම්බන්ධීකරණය තුළින් කාර්ය පටිපාටික ප්‍රමාදයන් ඉහළම මට්ටමකින් අඩු කළ හැකි වන අතර මේ සඳහා ස්වයංක්‍රීයකරණය කිරීම ද අවශ්‍ය වන අතර සිදුවිය හැකි අනවශ්‍ය ප්‍රතිද්විත්වකරණයන් වළක්වා ගැනීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමට ආයතන අතර සුදුසු පද්ධති බිහි කිරීම ද අවශ්‍ය වේ.

රෙගුලාසි, පනත්, පරිපාලන සංවිධානය ආදිය අතර විෂමතා හා අසංගතභාවයන් පිළිබඳව යෙදිය හැකි ප්‍රතිපෝෂක හඳුනා ගැනීම හා ප්‍රතිපෝෂක සැපයීම වෙනත් අරමුණු අතර වේ.

කාලසීමාව අඩු කිරීම සඳහා විවිධ ආකාරවල ආයෝජන ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා පවතින තීරණාත්මක කාර්ය පටිපාටි හඳුනා ගත යුතුය. ආයතනික කටයුතු ඉටු කර ඇති අතර එම කරුණු පිළිබඳව මූලික වශයෙන් සාකච්ඡා කිරීම සඳහා සතියකට එක් වතාවක් සියලුම සාමාජිකයන් රැස් වනු ඇත.

ඒ අනුව, අනාගතයේදී ඒ ඒ නියෝජිතයන් වෙතින් අනුමැතීන් ලබා ගැනීම ආයෝජකයන්ට අවශ්‍ය නොවනු ඇත. ආයෝජකයන් වෙනුවෙන් නිසි කාල සීමාව තුළ අවශ්‍ය කටයුතු සූදානම් කිරීම සම්බන්ධීකරණ නිලධාරීන් මගින් සිදුවනු ඇත.

### 3.1.2 **අපනයන කරුවන්ගේ සංසදය**

අපනයන කරුවන්ගේ ගැටළු සඳහා පිළියම් යෙදීමට මෙම අමාත්‍යාංශය හා අපනයන සංවර්ධන මණ්ඩලය ඕනෑම අවස්ථාවකදී මැදිහත් වීමට ඉඩකඩ සලසන අපනයන කරුවන්ගේ සංසදය දිවයිනේ අපනයන නිෂ්පාදන සඳහා පුනර්ජීවය ලබා දෙමින් අභිනව කැපවීමකින් යුක්තව නැවතත් ආරම්භ කරනු ලැබීය.

ව්‍යාපාරික ආයතන 20 ක් ඇතුළත වූ අපනයන සම්බන්ධ තීරණාත්මක ගැටළු 52 ක් පිළිබඳව 7 වන අපනයන කරුවන්ගේ සංසදයේ අවධානය යොමු කරනු ලැබීය. දිවයිනේ අග්‍රගන්‍ය අපනයන පහසුකම් සපයන ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය මගින් මෙම අවස්ථාව සම්බන්ධීකරණය කරන ලදී. අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු බහු ආංශික ගැටළු වන බැවින් ඒවා විසඳීම සඳහා බහු ආයතනික මැදිහත්වීම අවශ්‍ය වන අතර එක් ආයතනයකට පමණක් එවැනි ගැටළු විසඳිය නොහැකිය. ඒ සඳහා ආයතන කීපයක ඒකාබද්ධ ප්‍රයත්නයන් යෙදවීම අවශ්‍ය වේ. අපනයන කරුවන්ට මුහුණ පෑමට සිදුවූ විවිධාකාර ගැටළු විසඳීම සඳහා අපනයනකරුවනගේ සංසදය මගින් සමායෝජන කටයුතු සිදුකරනු ලැබේ.

### 3.1.3 **සංවර්ධනය සඳහා වූ නියෝජිත ආයතනය** හා **ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිත ආයතන**

සංවර්ධන උපායමාර්ග අමාත්‍යාංශය යටතේ සංවර්ධනය සඳහා වූ නියෝජිතායතන ස්ථාපනය කරන ලදී. සමස්ත ප්‍රතිපත්තියට අනුකූලව සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය සඳහා පහසුකම් සැලසීම, අමාත්‍යාංශ හා අදාළ ආයතනවලට මඟ පෙන්වීම හා ඒවා අතර ඉහළ මට්ටමේ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම තුළින් ජාතික ආර්ථික ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කරවීම මෙම නියෝජිතායතන ස්ථාපනය කිරීමේ අරමුණයි. ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන මනා පරිචයන් සැලකිල්ලට ගනිමින් නියෝජිතායතනය මගින් අනුගමනය කළ යුතු යෝජිත මෙහෙයුම් පිළිවෙත සම්පාදනය කරනු ලබයි. අංශවල විශේෂඥයින්ගෙන් සමන්විත වන කමිටුව උපදේශන කණ්ඩායම ලෙස පත්කරනු ලබන අතර එම කමිටුව ක්‍රමානුකූලව රැස්වේ. එයට සමාන ආකාරයෙන් ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති රාමුව සවිබල ගැන්වීම සඳහා වෙනම නියෝජිතායතනයන් ස්ථාපනය කර තිබේ. මෙම කමිටුව රාජ්‍ය හා පුද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. එමඟින් වර්තමානයේ විවිධ නියෝජිතායතන අතර විහිදී ඇති ජාත්‍යන්තර වෙළඳ කටයුතු ජාතික වෙළඳ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයක් යටතේ සුසංවිධිත වනු ඇත.

### 3.1.4 නිදහස් වෙළඳ කලාප සමීප අධීක්ෂණය

දිවයිනේ ආයෝජන කලාප 45 ක් ආරම්භ කිරීමේ නව වැඩසටහනක් මේ වනවිට රජය මගින් ප්‍රකාශයට පත්කර තිබේ. දැනට පවත්නා ආයෝජන කලාපවල පහසුකම් ඉහළ මට්ටමකට පත් කිරීමට පියවර ගත යුතුව තිබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ආර්ථික ප්‍රවර්ධන කලාප 12 ක් රට පුරා ව්‍යාප්තව පවතී. මෑතකදී නිදහස් වෙළඳ කලාප 6 ක් නරඹනු ලැබූ අතර භාවිතයට නොගත් ඉඩම් හා ක්‍රියාත්මක නොවන කර්මාන්තශාලා නිසි පරිදි තක්සේරු කිරීමට තීරණය කරන ලදී. ලබා දිය හැකි රැකියා ප්‍රමාණය ලබාදීමට ''රැකියා බැංකුව'' ස්ථාපනය කිරීමට හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුව තිබේ.

### 3.1.5 ව්‍යාපාරවල නිරතවීමේ දර්ශකය වැඩිදියුණු කිරීම හා ආයෝජන වාතාවරණය වැඩි දියුණු කිරීම.

කලාපීය සමපදස්ථ රටවලට සාපේක්ෂව 2002-2013 දක්වා කාල පරිච්ඡේද තුළ සාමාන්‍ය 6.3 ක් වන දළ දේශීය නිෂ්පාදනයේ සාපේක්ෂ ඉහළ වර්ධන වේගයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවිය. කෙසේ වුවද, අපේක්ෂිත මට්ටමින් වෙළඳපොල ප්‍රමාණය හා සාර්ව ආර්ථික රාමුව වැනි ආර්ථික තත්ත්වයන් හැරුණු විට රෙගුලාසි, කාර්ය පටිපාටි, ප්‍රවේශය හා අන්තඃ නියෝජිතායතන සම්බන්ධීකරණය යනාදිය ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා වැදගත් සාධක ලෙස හඳුනා ගත හැකිය. ව්‍යාපාර සිදු කිරීම සම්බන්ධයෙන් ව්‍යාපාරික ආයතනවලට බලපාන තෝරාගත් කරුණු 10 කට අදාළව රටේ තත්ත්වය පිළිබඳව සාපේක්ෂ මිනුමක් ලෝක බැංකුවේ (Ease of doing business) දර්ශකය මගින් සපයයි.

අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආයතන මගින් විදේශ සෘජු ආයෝජන, දේශීය ආයෝජන හා අපනයන අංශ සඳහා පහසුකම් සපයන අතරතුර, අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය තුළින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දියත් කිරීම සඳහා අමාත්‍යාංශය මගින් පියවර ගෙන තිබේ. ඒකාග්‍රතාවයකට පැමිණි ප්‍රතිඵල සමඟ ස්ථාවර ප්‍රතිසංස්කරණ පියවර සහිත මාර්ග සැලසුමක් පිළියෙළ කිරීම සඳහා (Ease of doing business) දර්ශකයට අදාළ එක් එක් මාතෘකා දහය යටතේ අදාළ ආයතනය වෙතින් උපදෙස් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් මහ බැංකුව හා අමාත්‍යාංශය මුලසුන දරණ කමිටුවක් මගින් සංවිධානය කර තිබේ.

### 3.1.6 තාක්ෂණය හා නවීකරණය මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්වල අපනයන සඳහා වන තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම.

ලෝක වෙළඳ පොලේ දේශීය නිෂ්පාදන සඳහා ඉඩකඩ වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව මගින් ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී තිබේ. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව අතර තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම හා ගෝලීය වටිනාකම් දාමයට ඇතුළත් වීම සඳහා ඔවුන්ට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම මේ සම්බන්ධයෙන් හඳුනාගත් එක් ක්‍රමෝපායක් වේ.

ගෝලීය ඉල්ලුමට ගැළපෙන පරිදි නවීකරණ හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් තුළින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව අතර අපනයන තරඟකාරීත්වය ඉහළ දැමීම සඳහා මාර්ග සිතියමක් පිළියෙළ කිරීමට අමාත්‍යාංශය මගින් ආරම්භක පියවර ගෙන තිබේ. විදේශ සෘජු ආයෝජන ඇතුළත් වන මහා පරිමාණ වෙළඳ ව්‍යාපාර හා දේශීය වෙළඳ ව්‍යාපාර අතර සම්බන්ධතා වැඩිදියුණු කිරීම අවධානය යොමු කළ යුතු තවත් එක් අංශයකි. මේ ආකාර හවුල්කරුවන් සඳහා තාක්ෂණික වැඩි දියුණු කිරීම් සමඟ නිරන්තර පුහුණු කිරීම් සැපයීම සහ කුසලතා සංවර්ධනය වැනි පූර්වාවශ්‍ය කීපයක් පැවතිය හැකිය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රය වන්නේ අපනයන සංවර්ධන මණ්ඩලයයි.

### 3.1.7 ඉන්දියාව සමඟ ගිවිසුම් ගත වීමට අපේක්ෂිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම.

ඉන්දියාව වැනි වඩාත් පුළුල් වෙළඳ ශක්‍යතාවයක් පවතින වෙළඳපළක් භාවිතා කිරීම සඳහා ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ ගිවිසුම පිළියෙළ කිරීමේ මූලික කටයුතු ආරම්භ කර තිබේ. පිළියෙළ කිරීමේ අදියරේ සිටම පුද්ගලික අංශයේ සහ මහජනතාවගේ අදහස් වඩාත් විනිවිදභාවයෙන් අන්තර්ගත කරන නව ගිවිසුමක් සම්පාදනය කිරීමේ කාර්යභාරය කර්මාන්ත හා වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්වරුන්ගෙන් හා වාණිජ අධ්‍යක්ෂ ජනරාල්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයන්, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයතන සංවර්ධන මණ්ඩලය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) වැනි නිලධාරීන්ගෙන් සමන්විත වන මෙහෙයුම් කමිටුවකට පැවරී ඇත. මෙයට පෙර පැවති CEPA ගිවිසුමේ අහිතකර අංශය පිළිබඳව සමාලෝචනයක් සිදු කෙරෙමින් පවතී. ගිවිසුම් රාමුවක අඩංගු කරුණු හා එහි විෂය පථය පිළිබඳව අවධානය යොමු කිරීම පිණිස ද, ඉන්දියාව වෙතින් ශ්‍රී ලාංකික අපනයනයන් සඳහා යම් සහනයක් අපේක්ෂාවෙන් 2015 දෙසැම්බර් මස අග භාගයේ ඉන්දියාව වෙත ශ්‍රී ලංකා දූත පිරිසක් යැවීමට කටයුතු සලසා තිබේ.

### 3.1.8 ජාතික වැදගත්කමකින් යුත් ගැටළු පිළිබඳව ඉතා වැදගත් වන අධීක්ෂණ කටයුතු මෙහෙයවීම.

- GSP +

GSP බදු සහනය කලාපීය ආර්ථික සංවර්ධනය පිළිබඳ වැදගත් ආර්ථික හැරවුම් ලක්ෂ්‍යයක් වන බව රජය විශ්වාස කරයි. 2016 වසරේ මැද භාගය වනවිට මෙම සහනය නැවත ලබා ගැනීමේ අරමුණින් මෙම අමාත්‍යාංශය විදේශ කටයුතු අමාත්‍යාංශය, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ නිරන්තර සම්බන්ධීකරණය පවත්වාගෙන යමින් කටයුතු කරයි.

- **ඉන්දියාව හා ජපානය සමඟ ද්විපාර්ශවික හමුවීම්වලදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.**

අග්‍රාමාත්‍යවරයාගේ ඉන්දීය සංචාර හා ජපාන සංචාර පිළිබඳව පසු විපරම් කටයුතු මේ වන විට අමාත්‍යාංශය මගින් සිදු කරමින් පවතී. අදාළ පාර්ශවයන් සමඟ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදීද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලැබීය. මේ වනවිට එවැනි රැස්වීම් 6 ක් පවත්වා ඇති අතර එහි ප්‍රගතිය ආර්ථික කළමනාකරණ කමිටුව වෙත කලින් කලට වාර්තා කරනු ලැබේ.

# 4. සාමාන්‍ය පරිපාලනය

## 4.1 හැඳින්වීම

ජාතික ආර්ථික සංවර්ධනය හා විදේශ වෙළඳාම සංවර්ධනය පිළිබඳ සුවිශේෂී සංවර්ධන සංධිස්ථානයන් මුදුන් පමුණුවා ගැනීමට අලුතින් ස්ථාපනය කරන ලද සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳම පිළිබඳ අමාත්‍යාංශය අපේක්ෂා කරයි. දිවයිනේ “Ease of doing business” ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා ගැනීමට පියවර ගැනීමත් සමඟ කෙටි කාල සීමාවක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ මට්ටමකට පත්කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමකාලීන ක්‍රියාවලි සංවර්ධනය, තීරණාත්මක ක්‍රියාමාර්ගයන් කෙටි කිරීම, අනවශ්‍ය පියවර ගැනීම් වළක්වා ගැනීම සහ තොරතුරු තාක්ෂණය භාවිතයට ගැනීම මගින් “doing business” පරාමිති අනිවාර්යෙන්ම වැඩි දියුණු කළ හැකි අතර මේ සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීමේ කටයුතු අමාත්‍යාංශය මගින් අඛණ්ඩව සිදුකරනු ලබයි.

ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි ආයෝජන හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබයි. ගැසට් නිවේදන ප්‍රසිද්ධ කිරීම, මෙහෙයුම් කටයුතු ඉටු කිරීම, විගණන හා කළමනාකරණ අධීක්ෂණ කටයුතු සිදුකිරීම සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සේවක සංඛ්‍යා කළමනාකරණය හා ධාරිතා සංවර්ධනයේදී පහසුකම් සැලසීම යනාදී ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා අමාත්‍යාංශයේ පරිපාලනය කැපවීමෙන් කටයුතු කරයි. මහජන දුක් ගැනවිලි සම්බන්ධයෙන් ද අමාත්‍යාංශය කැපවීමෙන් කටයුතු කරන අතර එවැනි අවස්ථාවලදී ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශය මගින් නිලධාරියෙකු යොදවා ඇත.

## 4.2 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

වගුව - 4.1 2015.12.31 දිනට කාර්යමණ්ඩල තොරතුරු

| තනතුර | 2015-10-28 දිනට අනුමත සේවක සංඛ්‍යාව | 2015-12-31 දිනට සේවයේ නිරත කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ලේකම් | 1 | 1 |
| අතිරේක ලේකම් | 2 | 2 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | - |
| අධ්‍යක්ෂ | 2 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 |
| ගණකාධිකාරී | 1 | - |
| සහකාර ලේකම් | 2 | - |
| සහකාර අධ්‍යක්ෂ | 4 | 2 |
| නීති නිලධාරී | 1 | 1 |
| අභ්‍යන්තර විගණක | 1 | - |
| ලේකම්වරයා සඳහා සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 |
| පරිපාලන නිලධාරී | 1 | - |
| සංවර්ධන නිලධාරී | 8 | 8 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 1 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 8 | 4 |
| ඡායාරූප ශිල්පී | 1 | - |
| විඩියෝ ඡායාරූප ශිල්පී | 1 | - |
| වීඩියෝ ඡායාරූප ශිල්පී සහායක | 1 | - |
| කාර්යාල සහායක | 7 | 5 |
| රියදුරු | 8 | 6 |
| මුළු ගණන | 53 | 31 |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ

ලේඛනය - 01

## 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | චාන්දනී විජයවර්ධන මිය | ලේකම් |
| 02 | පී.එම්.අනුර ද සිල්වා මයා | රාජ්‍ය ලේකම් |
| 03 | ඩබ්.ඒ.ඩී.එස්.ගුණසිංහ මයා | අති.ලේ. |
| 04 | ඩබ්.එම්.ආර්.පී.වීරසිංහ මයා | අති.ලේ. |
| 05 | ජී.සී.එන්.ෆොන්සේකා මිය | ප්‍ර.ගණකාධිකාරී |
| 06 | එන්.එම්.ඒ.ඩී.කේ. නවරත්න මිය | ස.අ. |
| 07 | සමිත දයාසේකර මයා | ස.අ. |
| 08 | ආර්.ජී.පී.ද සිල්වා මයා | ස.අ. |
| 09 | ආර්.එම්.එම්.බී.කුමාරි මෙය | නීති උපදේශක |
| 10 | ඩබ්.ඒ.සී.ඒ.රොද්‍රිගු මිය | සම්.ලේ. |
| 11 | කේ.ඩබ්.පී.පී. දිල්රුක්ෂි මෙය | සං.ස. |
| 12 | ආර්.ඩබ්.රෝෂිණී මෙය | සං.ස. |
| 13 | ජේ.ආර්.ඒ.එම්.පී.ජයවීර මෙය | සං.නි |
| 14 | කේ.එම්. වික්‍රමගේ මෙය | සං.නි. |
| 15 | එස්.එම්.පී.බී.සේනානායක මයා | සං.ස. |
| 16 | ඩී.ආර්.එල්.පෙරියප්පෙරුම මිය | සං.ස. |
| 17 | එල්.ඩී.එස්.සංජීවනී මෙය | සං.නි. |
| 18 | ඩබ්.එස්.හතරසිංහ මිය | සං.නි. |
| 19 | ඩී.ජී.ඩී.එස්.මාරසිංහ මිය | රා.ක.ස. |
| 20 | එල්.කේ.අංජලිකා මෙය | රා.ක.ස. |
| 21 | එච්.ඩී.සඳමාලි මෙය | රා.ක.ස. |
| 22 | එම්.එම්.මුණසිංහ මෙය | රා.ක.ස. |
| 23 | එල්.ඒ.පී.කේ.සම්පත් මයා | රියදුරු |
| 24 | කේ.එස්.පී.පුෂ්පකුමාර මයා | රියදුරු |
| 25 | කේ.එච්. ප්‍රියන්ත මයා | රියදුරු |
| 26 | ඒ.චන්දන පෙරේරා මයා | රියදුරු |
| 27 | ආර්.අබේවික්‍රම මයා | රියදුරු |
| 28 | සී.යූ.ඩබ්.රත්නායක මෙය | කා.කා.ස. |
| 29 | ජී.ඒ.සී.ප්‍රනාන්දු මයා | කා.කා.ස. |
| 30 | එම්.පී.මද්දුමගේ මයා | කා.කා.ස. |
| 31 | එල්.කේ.ඩබ්.සිරිසලනි මෙය | කා.කා.ස. |
| 32 | එම්.එම්.සී.විජයබණ්ඩාර | කා.කා.ස. |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

ලේඛනය - 02

## 2015 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 01. | එච්.පි. ජයනන්ද මයා | අතිරේක ලේකම් | 30.12.2015 |
| 02. | ජී.ඩී.එස්.පි. කුමාර මයා | සහකාර ලේකම් | 30.12.2015 |
| 03. | එම්.ඒ අමරසිංහ මයා | කළමනාකරණ සහකාර | 05.02.2015 |
| 04. | සි.එම්.තන්තිරිගේ මිය | සංවර්ධන නිලධාරි | 09.03.2015 |
| 05. | අයි.එස්. විදානපතිරණ මයා | රියදුරු | 02.07.2015 |
| 06. | කේ.එස්. ලොකුගේ මයා | රියදුරු | 07.09.2015 |
| 07. | එන්.එම්. අල්රියාඩ් මයා | රියදුරු | 03.09.2015 |
| 08. | ඒ.ඩී. ගුණවර්ධන මයා | කාර්යාල කාර්ය සහායක | 11.11.2015 |
| 09. | ඩබ්.එස්.පී.කේ. අමරසේකර මයා | කාර්යාල කාර්ය සහායක | 29.01.2015 |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

වගුව - 4.2 **වයස් කාණ්ඩ අනුව කාර්ය මණ්ඩල වර්ගීකරණය - 2015**

| අනු අංකය | වයස් සීමාව | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| 01. | 25> | 4 | 0 |
| 02. | 26-35 | 4 | 6 |
| 03. | 36-45 | 6 | 4 |
| 04. | 46-50 | 2 | 1 |
| 05. | 51-55 | 0 | 2 |
| 06. | 55< | 1 | 1 |
| **එකතුව** | | **17** | **14** |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

# 5. මූල්‍ය අංශය

මූල්‍ය ප්‍රගතිය 2014 - 2015

වගුව - 5.1 අමාත්‍ය කාර්යාලය

| වැය විෂය | | | | විස්තරය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.) | සත්‍ය වියදම(රු.) | ඉතිරිවීම්(රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | **පුද්ගල පඩිනඩි** | **3,650,000.00** | **1,430,325.75** | **2,219,674.25** |
| 1 | 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 1,500,000.00 | 687,647.99 | 812,352.01 |
| 1 | 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 | 112,298.04 | 387,701.96 |
| 1 | 0 | 1003 | 11 | වෙනත් | 1,650,000.00 | 630,379.72 | 1,019,620.28 |
| | | | | **ගමන් වියදම්** | **650,000.00** | **16,866.00** | **633,134.00** |
| 1 | 0 | 1101 | 11 | දේශීය ගමන් වියදම් | 150,000.00 | 16,866.00 | 133,134.00 |
| 1 | 0 | 1102 | 11 | විදේශීය ගමන් වියදම් | 500,000.00 | - | 500,000.00 |
| | | | | **සැපයීම්** | **1,620,000.00** | **607,057.34** | **1,012,942.66** |
| 1 | 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 250,000.00 | 80,619.00 | 169,381.00 |
| 1 | 0 | 1202 | 11 | ඉන්ධන | 1,350,000.00 | 507,023.34 | 842,976.66 |
| 1 | 0 | 1203 | 11 | ආහාර හා නිල ඇඳුම් දීමනා | 20,000.00 | 19,415.00 | 585.00 |
| | | | | **නඩත්තු වියදම්** | **1,305,000.00** | **1,260,903.89** | **44,096.11** |
| 1 | 0 | 1301 | 11 | වාහන නඩත්තු | 1,250,000.00 | 1,246,503.89 | 3,496.11 |
| 1 | 0 | 1302 | 11 | යන්ත්‍ර නඩත්තු | 25,000.00 | - | 25,000.00 |
| 1 | 0 | 1303 | 11 | ගොඩනැඟිලි නඩත්තු | 30,000.00 | 14,400.00 | 15,600.00 |
| | | | | **සේවා** | **955,000.00** | **608,063.36** | **346,936.64** |
| 1 | 0 | 1401 | 11 | ප්‍රවාහන නඩත්තු | 150,000.00 | 3,750.00 | 146,250.00 |
| 1 | 0 | 1402 | 11 | තැපැල් හා සන්නිවේදන වියදම් | 450,000.00 | 274,765.32 | 175,234.68 |
| 1 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 25,000.00 | 1,902.10 | 23,097.90 |
| 1 | 0 | 1405 | 11 | වෙනත් | 330,000.00 | 327,645.94 | 2,354.06 |
| | | | | **මාරු කිරීම්** | **75,000.00** | - | **75,000.00** |
| 1 | 0 | 1502 | 11 | විශ්‍රාම ප්‍රතිලාභ | 75,000.00 | - | 75,000.00 |
| | | | | **මූලධන වත්කම් වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්** | **1,250,000.00** | - | **1,250,000.00** |
| 1 | 0 | 2001 | 11 | ගොඩනැගිලි වැඩිදියුණු කිරිම | 1,000,000.00 | - | 1,000,000.00 |
| 1 | 0 | 2002 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ වැඩිදියුණු කිරිම | 50,000.00 | - | 50,000.00 |
| 1 | 0 | 2003 | 11 | වාහන වැඩිදියුණු කිරිම | 200,000.00 | - | 200,000.00 |
| | | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම.** | **1,840,000.00** | **1,688,874.50** | **151,125.50** |
| 1 | 0 | 2102 | 11 | ගෘහ උපකරණ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනිම | 1,690,000.00 | 1,688,874.50 | 1,125.50 |
| 1 | 0 | 2103 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනිම | 150,000.00 | - | 150,000.00 |
| **එකතුව** | | | | | **11,345,000.00** | **5,612,090.84** | **5,732,909.16** |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

වගුව - 5.2 අමාත්‍යාංශ කාර්යාලය

| වැය විෂය | | | | විස්තරය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ඉතිරිවීම් |
|---|---|---|---|---|---|---|---|
| | | | | **පුද්ගල පඩිනඩි** | **12,995,000.00** | **11,682,157.25** | **1,312,842.75** |
| 2 | 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 6,500,000.00 | 5,192,808.68 | 1,307,191.32 |
| 2 | 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 325,000.00 | 320,212.41 | 4,787.59 |
| 2 | 0 | 1003 | 11 | වෙනත් | 6,170,000.00 | 6,169,136.16 | 863.84 |
| | | | | **ගමන් වියදම්** | **1,100,000.00** | **885,691.05** | **214,308.95** |
| 2 | 0 | 1101 | 11 | දේශීය ගමන් වියදම් | 300,000.00 | 106,842.13 | 193,157.87 |
| 2 | 0 | 1102 | 11 | විදේශීය ගමන් වියදම් | 800,000.00 | 778,848.92 | 21,151.08 |
| | | | | **සැපයීම්** | **1,535,000.00** | **1,073,236.19** | **461,763.81** |
| 2 | 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 700,000.00 | 432,709.46 | 267,290.54 |
| 2 | 0 | 1202 | 11 | ඉන්ධන | 585,000.00 | 513,411.62 | 71,588.38 |
| 2 | 0 | 1203 | 11 | ආහාර හා නිල ඇඳුම් දීමනා | 50,000.00 | 16,092.00 | 33,908.00 |
| 2 | 0 | 1205 | 11 | වෙනත් | 200,000.00 | 111,023.11 | 88,976.89 |
| | | | | **නඩත්තු වියදම්** | **1,070,000.00** | **960,356.63** | **109,643.37** |
| 2 | 0 | 1301 | 11 | වාහන නඩත්තු | 920,000.00 | 914,004.14 | 5,995.86 |
| 2 | 0 | 1302 | 11 | යන්ත්‍ර නඩත්තු | 100,000.00 | 46,352.49 | 53,647.51 |
| 2 | 0 | 1303 | 11 | ගොඩනැඟිලි නඩත්තු | 50,000.00 | - | 50,000.00 |
| | | | | **සේවා** | **51,110,000.00** | **50,854,177.45** | **255,822.55** |
| 2 | 0 | 1401 | 11 | ප්‍රවාහන නඩත්තු | 250,000.00 | 207,365.95 | 42,634.05 |
| 2 | 0 | 1402 | 11 | තැපැල් හා සන්නිවේදන වියදම් | 800,000.00 | 666,344.27 | 133,655.73 |
| 2 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 50,000.00 | 39,995.80 | 10,004.20 |
| 2 | 0 | 1404 | 11 | ගොඩනැඟිලි කුලී | 49,760,000.00 | 49,741,315.46 | 18,684.54 |
| 2 | 0 | 1405 | 11 | වෙනත් | 250,000.00 | 199,155.97 | 50,844.03 |
| | | | | **මාරු කිරීම්** | **175,000.00** | **56,141.34** | **118,858.66** |
| 2 | 0 | 1506 | 11 | රාජ්‍ය සේවක දේපල ණය පොලී | 175,000.00 | 56,141.34 | 118,858.66 |
| | | | | **මූලධන වත්කම් වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්** | **4,100,000.00** | **782,142.01** | **3,317,857.99** |
| 2 | 0 | 2001 | 11 | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | 1,100,000.00 | | 1,100,000.00 |
| 2 | 0 | 2002 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ වැඩිදියුණු කිරීම | 2,000,000.00 | 71,864.36 | 1,928,135.64 |
| 2 | 0 | 2003 | 11 | වාහන වැඩිදියුණු කිරීම | 1,000,000.00 | 710,277.65 | 289,722.35 |
| | | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම.** | **250,000.00** | **113,114.32** | **136,885.68** |
| 2 | 0 | 2102 | 11 | ගෘහ උපකරණ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම | 250,000.00 | 113,114.32 | 136,885.68 |
| | | | | **හැකියා වර්ධනය** | **300,000.00** | **164,000.00** | **136,000.00** |
| 2 | 0 | 2401 | 11 | කාර්ය මණ්ඩල සංවර්ධන | 300,000.00 | 164,000.00 | 136,000.00 |
| **එකතුව** | | | | | **72,635,000.00** | **66,571,016.24** | **6,063,983.76** |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

වගුව 5.3 රාජ්‍ය අමාත්‍ය කාර්යාලය

| වැය විෂය | | | | විස්තරය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ඉතිරිවීම් |
|---|---|---|---|---|---|---|---|
| | | | | **පුද්ගල පඩිනඩි** | **3,650,000.00** | **2,555,257.01** | **1,094,742.99** |
| 11 | 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 1,500,000.00 | 1,200,689.98 | 299,310.02 |
| 11 | 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 | 88,258.19 | 411,741.81 |
| 11 | 0 | 1003 | 11 | වෙනත් | 1,650,000.00 | 1,266,308.84 | 383,691.16 |
| | | | | **ගමන් වියදම්** | **650,000.00** | **462,482.00** | **187,518.00** |
| 11 | 0 | 1101 | 11 | දේශීය ගමන් වියදම් | 150,000.00 | 15,100.00 | 134,900.00 |
| 11 | 0 | 1102 | 11 | විදේශීය ගමන් වියදම් | 500,000.00 | 447,382.00 | 52,618.00 |
| | | | | **සැපයීම්** | **1,620,000.00** | **892,432.81** | **727,567.19** |
| 11 | 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 250,000.00 | 92,307.93 | 157,692.07 |
| 11 | 0 | 1202 | 11 | ඉන්ධන | 1,350,000.00 | 780,487.01 | 569,512.99 |
| 11 | 0 | 1203 | 11 | ආහාර හා නිල ඇඳුම් දීමනා | 20,000.00 | 19,637.87 | 362.13 |
| | | | | **නඩත්තු වියදම්** | **555,000.00** | **189,531.93** | **365,468.07** |
| 11 | 0 | 1301 | 11 | වාහන නඩත්තු | 500,000.00 | 189,531.93 | 310,468.07 |
| 11 | 0 | 1302 | 11 | යන්ත්‍ර නඩත්තු | 25,000.00 | | 25,000.00 |
| 11 | 0 | 1303 | 11 | ගොඩනැගිලි නඩත්තු | 30,000.00 | | 30,000.00 |
| | | | | **සේවා** | **805,000.00** | **259,784.24** | **545,215.76** |
| 11 | 0 | 1401 | 11 | ප්‍රවාහන නඩත්තු | 150,000.00 | 620.00 | 149,380.00 |
| 11 | 0 | 1402 | 11 | තැපැල් හා සන්නිවේදන වියදම් | 450,000.00 | 77,789.95 | 372,210.05 |
| 11 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 25,000.00 | 5,704.29 | 19,295.71 |
| 11 | 0 | 1405 | 11 | වෙනත් | 180,000.00 | 175,670.00 | 4,330.00 |
| | | | | **මාරු කිරීම්** | **75,000.00** | | **75,000.00** |
| 11 | 0 | 1502 | 11 | විශ්‍රාම ප්‍රතිලාභ | 75,000.00 | | 75,000.00 |
| | | | | **මූලධන වත්කම් වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්** | **1,250,000.00** | **191,383.32** | **1,058,616.68** |
| 11 | 0 | 2001 | 11 | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | 1,000,000.00 | | 1,000,000.00 |
| 11 | 0 | 2002 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ වැඩිදියුණු කිරීම | 50,000.00 | | 50,000.00 |
| 11 | 0 | 2003 | 11 | වාහන වැඩිදියුණු කිරීම | 200,000.00 | 191,383.32 | 8,616.68 |
| | | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම.** | **500,000.00** | **263,405.00** | **236,595.00** |
| 11 | 0 | 2102 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම | 350,000.00 | 263,405.00 | 86,595.00 |
| 11 | 0 | 2103 | 11 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම | 150,000.00 | | 150,000.00 |
| | | | | **එකතුව** | **9,105,000.00** | **4,814,276.31** | **4,290,723.69** |

මූලාශ්‍රය: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

# 6. උපලේඛන

## සංවිධාන ව්‍යුහය

